00021

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**EPD3335/ESD1135 - පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික මට්ටමේ ඉගැන්වීම් සඳහා සමෝධානිත පිවිසුම.**

කාලය - පැය දෙකයි. (02)

දිනය - 2023.07.29 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සමෝධානිත ඉගෙනුම් - ඉගැන්වීම් ප්‍රවේශය තුළ තක්සේරු කිරීමෙන් ලැබෙන වාසි තුනක් (03) ලියන්න.

02. ප්‍රාථමික පාසල් දරුවන්ගේ ඇගයීම් වාර්තා පවත්වාගෙන යාමෙන් ලැබෙන වාසි තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

03. සමෝධානිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ විශේෂ ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න.

04. සාම්ප්‍රදායික ඉගැන්වීම් ප්‍රවේශයේ සහ සමෝධානිත ඉගැන්වීම් ප්‍රවේශයේ වෙනස කුමක් ද?

05. සමෝධානිත ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රාථමික පාසල් දරුවන් විසින් අත්හදා බැලීම් (පරීක්ෂණ) සහ ගවේෂණ තුළින් දැනුම ලබා ගැනීමේ වැදගත්කම කෙටියෙන් ලියන්න.

06. පෙරපාසල් දරුවන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදී සිටින විට ඔවුන් තුළින් දක්නට ලැබෙන ලක්ෂණ පහක් (05) ලැයිස්තුගත කරන්න

07. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික විෂයමාලාවට හඳුන්වා දුන් සමෝධානිත විෂයයන් තුනක් (03) නම් කරන්න.

08. "සමෝධානිත ප්‍රවේශය" යන යෙදුමෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) "සේවාස්ථ ගුරු පුහුණුව" යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහනක අරමුණු තුනක් (03) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන ගැටලු මොනවා ද? (ලකුණු 15)

10. (i) "සමෝධානිත ප්‍රවේශය" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) "වෙළඳපොළ" තේමාව පදනම් කරගෙන සමෝධානිත ඉගෙනුම් -ඉගැන්වීම් ප්‍රවේශය භාවිත කරමින් තුන්වන ශ්‍රේණියේ ළමුන් සඳහා සුදුසු පාඩම් සැලැස්මක රූප සටහන් අඳින්න. (ලකුණු 12)

(iii) ඔබ විසින් සකස් කරන ලද පාඩම් සැලැස්ම මත පදනම් ව පාඩම ක්‍රියාත්මක කිරීමෙන් සිසුන් ලබන වාසි තුනක් (03) ලියන්න. (ලකුණු 05)

11. "සමෝධානිත ප්‍රවේශය" යනු සමෝධානිත ඉගෙනුම් සංදර්භය තුළ ඉගෙනුම් කේන්ද්‍රීය පරිසරයක ක්‍රියාවෙන් ඉගෙනුම ලැබීමයි.

(i) ශ්‍රී ලංකාවේ සමෝධානිත ප්‍රවේශයේ ඉතිහාසය සාකච්ඡා කරන්න. (ලකුණු 03)

(ii) සමෝධානිත ප්‍රවේශයේ වාසි ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(iii) සමෝධානිත ප්‍රවේශය සඳහා තේමාවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු තුනක් (03) සඳහන් කර සුදුසු උදාහරණ සමග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. (i) "කාර්ය සාධන ගොනුව" යන පදයෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 06)

(ii) ප්‍රාථමික සිසුන් තුළ තක්සේරු ක්‍රමයක් ලෙස කාර්ය සාධන ගොනුවේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 14)

13. (i) ප්‍රාථමික පාසලේ සමෝධානිත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම සඳහා 1972 දී හඳුන්වා දුන් විෂයයක් නම් කරන්න. (ලකුණු 04)

(ii) සමෝධානිත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම විෂයයන් තෝරා ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අදාල පන්ති කාමරයක් තුල සමෝධානිත ප්‍රවේශය ක්‍රියාත්මක කළ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(හිමිකම් ඇවිරිණි.)